VIDUS 4-223-13

# වන සම්පත්

ශ්‍රී භාරති

නියෝජ්‍ය වන සංරක්ෂක

පෘථුවි තලය මත පවත්නා පැරණිතම ජීව දර්ශය විය හැකි නිවර්තන කලාපීය වනාන්තරය අප තුල වැඩි අවබෝධයක් නොමැති සහජීවනයන් සහ සූක්ෂම සහයෝගිතා ක්‍රියාවලින් සමූහයක සංකලනයෙන් සැදුම් ලත් සංකීර්ණ පද්ධතියකි. ඓතිහාසික යුගයන්හි පෘථුවි තලයෙහි වැඩි කොටස වසා පැතිරි උත්කර්ෂවත් වර්ගයේ වනාන්තරයන්හි විනාශයට මූලික වශයෙන් හේතු සාධක වූයේ තාක්ෂණික විද්‍යාවෙහි සහ සීඝ්‍රයෙන් වැඩිවන මිනිස් ජන ගහනයෙහි බලපෑමයි. තවත් පරම්පරාවක් අවසන්වීමට මත්තෙන් නිවර්තන කලාපීය වනාන්තර අභාවයට යනු ඇතැයි, ''නිවර්තන කලාපීය වර්ෂා වනාන්තර'' නම් කෘතිය රචනා කල ශ්‍රේෂ්ඨ පරිසර විද්‍යාඥ පෝල් රිචර්ඩ්ස් අනාවැකි පළ කරයි.

කෙසේ වුවද, නූතන මිනිසා ජීවත්වීම සහ ස්වකීය පැවැත්ම සඳහා දරන ප්‍රයත්නයේ දී නැවතත්, තම පාරම්පරික නිවහන වූ වනාන්තරය විපුල ස්වාභාවික සම්පතක් වේයයි ද පැලෑටි වලට සහ මිනිසා ඇතුළු සත්වයිනට රැකවරණ සැලසීමේ කාර්ය භාරය ඒ කරා පැවරී ඇතැයි ද සැලකීමට පටන් ගෙන ඇත.

වනාන්තර මගින් ආරක්ෂක, නිශ්පාදක, සහ සෞන්දර්යාත්මක කාර්ය භාරයක් ඉටුවන බැව්, ''වනාන්තරය මගින් ඛාදනය වළකාලයි; කෘෂිකර්මය සුරකෙයි: ජල ගැලීම් අඩු කරලයි; පවිත්‍ර ජලය ලබා දෙයි; ප්‍රසන්නතාවය හා විනෝද සුවය ගෙන දෙයි; වන සතුන් රැක දෙයි; පොදුවේ පරිසරය කෙලෙසීමට එරෙහිව ආරක්ෂාව සලසමින් පරිසර දූෂණය අඩු කරලයි; ගිනි දව සපයයි; සෑම ක්ෂේත්‍රයකම මිනිස් කටයුතු කෙරෙහි බලපාන දැව කාර්මික නිෂ්පාදන සපයයි. රැකියාද සපයයි; ලුහුඬින් පවසතොත් වනාන් තර මගින් මිනිස් සංහතියෙහි පරිසරීය, සමාජීය හා ආර්ථික ප්‍රගතියට අදාලව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කෙරෙයි.'' යනුවෙන් සඳහන් වන විද්‍යාව පිළිබඳ හත් වන ලෝක සමුළුවෙහි ප්‍රකාශන යෙන් මැනවින් විදහා දක්වෙයි.

දේශගුණයෙහි බලපෑම මධ්‍යස්ථ කරලීමේ සහ වායුගෝලීය කෙලෙසීමෙන් ඇතිවන පලවිපාක මෘදු කරලීමේ ලා වනාන්තර යන්ගෙන් ඉටු වනුයේ ඉතා වැදගත් මෙහෙයකි. වර්ෂාවෙහි සහ සුලඟෙහි අනියත ප්‍රතිඵල සමනය කරලීමට ද, සෝදා පාළුව වැළැක් වීමට ද, පසෙහි ජල තලය පාලනය කිරීමට ද වනාන්තර උපකාරක වෙයි. එහෙයින් වත්මනෙහි වනාන්තර වලින් ඉටුවන නිෂ්පාදක කාර්යභාරයට වඩා ඉන් ඉටුවන ආරක්ෂක මෙහෙය ප්‍රමුඛ තැනෙක ලා සලකනු ලැබීම විශ්මය ජනක නොවේ. වනාන්තරයෙහි නිෂ් පාදකතා කාර්ය භාරය පහසුවෙන් ප්‍රමාණ කළ හැකිය. එහෙත් එමගින් ඉටුවන ආරක්ෂක මෙහෙය ප්‍රමාණ කිරීම එතරම් පහසු නොවේ. මෙම දුෂ්කරතාවය නිසා ජාතික ආර්ථික ව්‍යුහය තුළ වනාන්තරයන්හි ඇති වැදගත්කම නිශ්චිතව තක්සේරු කිරීම අපහසු වෙයි.

ශ්‍රී ලංකාව, වර්ග සැතපුම් 25,332 ක හෙවත් අක්කර දශ ලක්ෂ 16 ක පමණ භූමි ප්‍රමාණයකින් සමන්විතය. 1956 වර්ෂය වන විට, මෙම භූමි ප්‍රමාණයෙන් අක්කර දශ ලක්ෂ 7 ක්, එනම් 45% ක් වනාන්තරයෙන් ගැවසී තිබිණ. 1956 සහ 1980 යන වර්ෂ අතර කාල සීමාව තුල, වනාන්තර ප්‍රදේශය සැලකියයුතු අන්දමින් ක්ෂයවීමෙන් දැනට මුළු භූමි ප්‍රදේශයෙන් අක්කර දශ ලක්ෂ 4 ක් හෙවත් 25% ක් පමණක් වනාන්තර වශයෙන් ශේෂව පවතී.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වර්ෂා පතන ප්‍රදේශ තුනකි. එනම් තෙත්, අන්තර් මධ්‍ය සහ වියලි යන කලාපයි. මේ සෑම ප්‍රදේශයක්ම ඒ ඒ ප්‍රදේශයට ආවේනික වූත්, ශාක සංයුතිය අතින් සෙසු ප්‍රදේශ යන්හි වනාන්තරයන්ගෙන් වෙනස් වූත්, වනාන්තර වර්ගයක් දයාද කොට ගෙන ඇත. ඇතැම් ශාක විශේෂයන් තෙත් කලාප යෙහි පමණක් වැඩෙන අතර වෙනත් ඇතැම් විශේෂයන් වියළි කලාපයට සීමාවී ඇත. වියළි කලාපයේ වැඩෙන ශාක විශේෂයන් මෙන්ම තෙත් කලාපීය විශේෂයන්ද, අන්තර් මධ්‍ය කලාපයේ සමව වැඩෙති.

දේශගුණික වශයෙන් ප්‍රභේද කොට දක්වා ඇති මෙම කලාප තුන තුල තත්වය (දැව නිශ්පාදනයෙන්) අනුව ඒ ඒ වර්ගයේ සහ ඒ ඒ විශේෂයේ ශාක ව්‍යාප්තිය සිදුව ඇත්තේ ස්ථානීය සාධක යන්හි අනුකලනය අනුවය. පසෙහි තෙතමනය, වයනය, ගැඹුර, පාරගම්‍යතාවය සහ පෝෂණ ද්‍රව්‍ය අන්තර්ගතය, භූමියෙහි බෑවුම සහ මිනිස් කටයුතු ප්‍රමාණය මෙසේ බලපාන සාධක අතර ප්‍රමුඛ ස්ථානය උසුලයි.

දිවයිනෙහි නිරිතදිග ප්‍රදේශයෙහි (තෙත් කලාපයෙහි) හෙක්-ටෙයාර් 152,000 මුළු භූමි ප්‍රදේශයක් සදහරිත වර්ෂා වනාන්තර යන්ගෙන් වැසී පවතියි. දැව නිශ්පාදන අංශයෙන් සලකා බලන කල සදෘශාකාර තෙත් සදහරිත වනාන්තර පමණටම විශිෂ්ට නොවන්නාවූ මොන්ටේන් වනාන්තර හෙක්ටෙයාර් 40,000 ක් මෙයට ඇතුලත් වන අතර, අන්තර් මධ්‍ය කලාපීය වනාන්තර හෙක්ටෙයාර් 81,000 ක් ඉන් පරිබාහිර වෙයි. දැනට තෙත් කලාපීය සහ අන්තර් මධ්‍ය කලාපීය වන්නාතර ප්‍රමාණය මුළු වන ප්‍රදේශ යෙන් 8% ක් වන අතර මේවා වැඩිවශයෙන්ම පිහිටා ඇත්තේ ලඟා වීමට දුෂ්කරවූ කඳුකර ප්‍රදේශයන්හි ය.

දිවයිනෙහි තෙත් කලාපයෙහි, මෙතෙක් උපයෝගී කොට නොගත් දැව සම්පත් ඒකරාශිවී ඇති නමුදු ඒවා අතිශයින්ම වැද ගත් වූ දිය බෙත්ම පෙදෙස්හි පිහිටීම හේතුකොට ගෙන එකී වනාන්තර පාලනය පිළිබඳ අතිරේක ප්‍රශ්නයක් උද්ගත වෙයි. මෙම වනාන්තරයන්හි දක්නට ලැබෙන වඩාත් වැදගත් රුක් විශේෂ යන් මෙසේය :

දන්, හොර, නා (මෙසූආ ෆේරිඒ)
කටබොඩ (කුලෙනියා විශේෂයක්)
මලබොඩ (මිරිස්ටිකා ඩැක්ටයිලොයිඩ්)
පෙලෙන් (කුරුම්යා සෙලනිකා)
ගුරුකීන (කැලෝෆයිලම් කැලබා)

වියළි කලාපීය වර්ගයේ වනාන්තර, හෙක්ටෙයාර් දශ ලක්ෂ 1.7 ක පමණ බිම් ප්‍රදේශයක්, එනම් මුළු වන ප්‍රදේශයෙන් 82% ක් පමණ, වසා පැතිර ඇත. මෙම වනාන්තර ඝනව වැඩී නොතිබීම සහ බිම් ඒකකයකට ලැබෙන වාර්ෂික නිශ්පාදනය අඩුවීම නිසා ඒවා ආර්ථික වටිනාකමින් හීනය. තවද, මෙම වනාන්තරයන්හි උපයෝගී කොට ගත හැකි රුක් විශේෂයන් අල්ප වන අතර, ඒවා තැනින් තැන විස්තීර්ණව පවතී. මෙහි ප්‍රධාන ගස් වර්ග අතර වීර, මොර, වෙලං, මිල්ල, බුරුත, හල්මිල්ල සහ කෝන් දක්නට ලැබෙයි.

78.12.31 දිනට ශ්‍රී ලංකාවේ පැවති ස්වාභාවික වනාන්තර ප්‍රමාණයන්, 1 වන චක්‍රයෙන් දැක්වේ.

## වන සංරක්ෂගේ පාලන වාර්තාව — 1978.
### චක්‍ර අංක 1.

### 78.12.31 දිනට ස්වාභාවික වනාන්තර (රක්ෂිත වනාන්තර) අක්කර ගණන.

| දිසා ඒකකය | ප්‍රදේශ ඒකකය | රක්ෂිත වන ප්‍රමාණය | සම්පූර්ණ භූමිප්‍රමාණ යෙන් ප්‍රතිශතය |
|---|---|---|---|
| **දකුණු දිසාව.** | | | |
| දකුණු පළාත | 13,73,440 | 1,32,994 | 9.68 |
| **උඩරට දිසාව.** | | | |
| ඌව පළාත | 20,19,200 | 21,657 | 1.07 |
| මධ්‍යම පළාතේ මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්ක .... | 8,79,360 | 1,04,722 | 11.91 |
| **උතුරු දිසාව.** | | | |
| උතුරු පළාත .... | 21,52,320 | 4,28,728 | 19.92 |
| **උතුරු මැද දිසාව.** | | | |
| උතුරු මැද පළාත .... | 25,61,280 | 4,33,474 | 16.92 |
| නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය .... | 7,45,600 | 1,69,127 | 22.10 |
| **නැගෙනහිර පළාත.** | | | |
| නැගෙනහිර පළාතේ මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්ක | 18,37,440 | 5,22,606 | 28.44 |
| **වයඹ දිසාව.** | | | |
| වයඹ පළාත .... | 19,18,080 | 3,29,715 | 17.19 |
| මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කය .... | 5,92,000 | 36,105 | 6.10 |
| සබරගමු පළාත (කොටසක්) | 2,82,880 | 6,994 | 2.45 |
| බස්නාහිර පළාත ,, | 1,40,800 | 4,430 | 3.15 |
| **බස්නාහිර දිසාව.** | | | |
| බස්නාහිර පළාත ,, | 7,75,680 | 56,366 | 7.27 |
| සබරගමු පළාත ,, | 9,33,760 | 1,16,871 | 12.52 |
| එකතුව : .... | 1,62,11,846 | 23,63,762 | 14.58 |

### චක්‍ර අංක ii.
### ශ්‍රී ලංකාවේ ස්වාභාවික වනාන්තර සහ වනෝද්‍යාන.

| වර්ගය | භූමි ප්‍රමාණය — හෙක්ටෙයාර් | | |
|---|---|---|---|
| | 1975 | 1976 | 1977 |
| ප්‍රකාශයට පත්කල රක්ෂිත වනාන්තර .... | 4,70,774 | 4,70,955 | 4,70,183 |
| යෝජිත රක්ෂිත වනාන්තර .... | 4,82,826 | 4,82,799 | 4,82,825 |
| වෙනත් රජයේ වනාන්තර .... | 17,62,753 | 8,09,717 | 8,09,717 |
| ජාතික වනෝද්‍යාන .... | 3,04,557 | 3,04,557 | 3,04,570 |
| අන්තර් මධ්‍ය කලාප .... | 36,092 | 36,092 | 36,092 |
| ස්වාභාවික රක්ෂිත වනාන්තර .... | 55,517 | 44,841 | 63,914 |
| වනාන්තර කොරිඩෝර | 10,517 | 10,517 | 10,364 |
| අභයභූමි .... | 1,99,928 | 1,99,928 | 2,05,222 |

ඉකුත් කාලපරිච්ඡේදය තුල ස්වාභාවික වනාන්තර තිවූ අන්දමින් උපයෝගී කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සීඝ්‍ර ලෙස කැලෑ එළිපෙහෙලි කරනු ලැබීම නිසා දැන් එම ක්‍රියා මාර්ගය අපට තවදුරටත් අනුගමනය නොකළ හැකි තත්වයක් උදාවී ඇත. (වනෝද්‍යාන ඇතුළුව දැනට පවතින ස්වාභාවික වනාන්තර ප්‍රමාණය චක්‍ර අංක ii න් පෙන්නුම් කර ඇත.) මෙම තත්වය හේතුකොටගෙන දැව සැපයීමේ කාර්යභාරය ස්වාභාවික වනාන්තර කෙරෙන් ඉවත්වී මිනිසා විසින් වගා කරන ලද වනාන්තර කරා පැවරී ඇත

වන වගාව, 1980 වසරේදී තේක්ක හෙක්ටෙයාර් 20 ක තරම් සුළු වගාවකින් ඇරඹීන. කැලෑ දෙපාර්තමේන්තුව මගින් දරන ලද ප්‍රයත්නයන්හි ප්‍රතිඵල වශයෙන් වගාකල වනාන්තර ප්‍රදේශය සීඝ්‍රයෙන් ව්‍යාප්තවීමෙන් 1976 වසර වන විට, විශේෂයෙන් තේක්ක (ටෙක්ටොනා ග්‍රෑන්ඩිස්) ඇතුළු විවිධ වර්ගයේ ගස් වගා කළ බිම් ප්‍රදේශය හෙක්ටෙයාර් 101,345 දක්වා පුළුල් විය. දැනට කරනු ලබන පරිදි වසරකට හෙක්ටෙයාර් 8000 ක (අක්කර 20,000 ක) පමණ වේගයකින් කැලෑ වගාකිරීමෙන් ක්‍රි.ව. 2000 වන විට නැවත වගාකළ බිම් ප්‍රමාණය හෙක්ටෙයාර් 300,000 (අක්කර දශ ලක්ෂ 0.75) ක් හෙවත් මුළු භූමි ප්‍රදේශයෙන් 4.6% ක් දක්වා වැඩි වෙතැයි අපේක්ෂා කෙරේ. වියළි කලාපයේ වගාව සඳහා බහුලව යොදගනුයේ තේක්ක සහ ඉයුකැලිප්ටස් විශේෂයන්ය. අන්තර් මධ්‍යම කලාපයේ ප්‍රධාන වශයෙන්ම භාවිතාවූයේ මැහොගනිය. බටහිර මොන්වේන් කලාපයන්හි පයිනස් යූකැලිප්ටස් වැනි ශාක විශේෂයෙන් පුළුල් ලෙස වගා කරනු ලබයි. ඉපිල් ඉපිල් වියළි කලාපයට මෑත අවධියේදී ප්‍රවිෂ්ඨ කරන ලද තවත් වර්ගයකි. මෙකී ශාක වර්ග සීඝ්‍ර වැඩීමකින් යුත් විදේශීය ශාක විශේෂයන් වෙයි. විදේශීය වර්ගයනට වඩා වර්ධන වේගයෙන් අඩු දේශීය ශාක වර්ගද සුළු වශයෙන් වගා කරනු ලබයි.

### චක්‍ර අංක iii

### වගාවන් පිළිබඳ වාර්තාව.

| වර්ගයන් | 78.12.31 දිනට භූමි ප්‍රමාණය (අක්කර) |
|---|---|
| තේක්ක .... .... | 1,61,386 |
| යුකැලිප්ටස් .... .... | 30,897 |
| කොස් / මැහොගනි .... .... | 11,910 |
| කොස් .... .... | 10 |
| මැහොගනි — පේලි සිටුවීම .... | 45,802 |
| නැදුන් — පේලි සිටුවීම .... | 102 |
| සැහැල්ලු තද දැව .... .... | 4,777 |
| උණ ගස් .... .... | 2,756 |
| පයිනස් .... .... | 27,758 |
| සයිප්‍රස් /පයිනස් .... .... | 1,981 |
| සියඹලා .... .... | 49 |
| ඇරෝකේරියා කනිංහමයි .... .... | 29 |
| ඇල්ස්ටෝනියා .... .... | 45 |
| කැෂුවරිනා .... .... | 505 |
| හුලංහික් .... .... | 84 |
| නැදුන් .... .... | 200 |
| මිල්ල .... .... | 9 |
| කුඹුක් .... .... | 49 |
| ඇත්දෙමට .... .... | 295 |
| මැහොගනි / හල්මිල්ල .... .... | 10 |
| ඇකේෂියා මොලිසිමා .... .... | 3 |
| ග්‍රැවිලියා රොබස්ටා .... .... | 3 |
| කුඩුම්බෙරියා .... .... | 14 |
| උණ බම්බු / යුකැලිප්ටස් .... .... | 888 |
| වූනා — පේලි සිටුවීම .... | 35 |
| කැලිට්‍රස් .... .... | 5 |
| කොහොඹ .... .... | 422 |
| හල්මිල්ල .... .... | 37 |
| මිශ්‍ර .... .... | 307 |

වක්‍ර අංක iii මගින්, මුළු වනවගා ප්‍රමාණය ඒ ඒ ගස් වර්ග වවා ඇති අක්කර ප්‍රමාණය අනුව ගෙනහැර දක්වා ඇත.

රාජ්‍ය දැව සංස්ථාවේ සමස්ථ ආදායමෙන්, වගාකල දැවවලින් ලැබුණු සංරචකය අධික වීමෙන් පිළිබිඹු වන පරිදි, ශ්‍රී ලංකාවේ වගාකල වනාන්තර වලින් ප්‍රමිත තත්වයේ අග්‍රගණ්‍ය දැව නිෂ්පාදනය වෙයි. 1976 වර්ෂයේදී රාජ්‍ය දැව සංස්ථාව මගින් උපයන ලද රු. දශ ලක්ෂ 54 ක මුළු ආදායමෙන්, වන වගාවන්ගෙන් ලබා ගත් දැවවලින් ලත් ආදයම රු. දශ ලක්ෂ 13 ක් විය. වගාකළ වනාන්තර ක්‍රමයෙන් පරිණත වීමත් සමග ලැබෙන ආදයම සීඝ්‍රයෙන් ඉහල යාමට ඉඩ ඇත.

වගාකරන ලද ශාක විශේෂයන් අතුරින් උපරිම සමාජ – ආර්ථික ප්‍රතිලාභ අත්වනුයේ තේක්ක වලිනි. ඉතා මධ්‍යස්ථ අයුරින් තක්සේරු කලද තේක්ක වගාවක වටිනාකම වසර 50 ක පමණ සශ්‍යමාරු කාල සීමාවකදී හෙක්ටෙයාර් 1 / රු. 100,000 ක් පමණ වන බැව් සැලකීමේදී, තේක්ක වගාවෙහි ප්‍රාග්ධන අගය කෙතෙක් දැයි මැනගත හැකිය.

හුදු සුවිශාලත්වය සහ අභිප්‍රාය අනුව මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ශ්‍රී ලංකාවේ මෙතෙක් අරඹන ලද විශාලතම සංවර්ධන ව්‍යාපාරය වන්නේය. මෙහිදී ඉතිහාසයේ ප්‍රථම වතාවට වාරිමාර්ග සහ ජල විදුලිබල යෝජනා ක්‍රමයක් සඳහා කැපකරන වෘක්ෂලතාදියෙහි මුළු අගය, යෝජනා ක්‍රමයෙන් ඇතිවන ප්‍රතිලාභ උපරිම කරගැනීම සහ පවත්වා ගැනීම උදෙසා අවශ්‍යක යෙදවුමක් වශයෙන් පිළිගන්නා ලදී. මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ, ජලසම්පාදිත කෘෂිකර්මය, මෙගවොට් 500 ක ජල විදුලි බල නිෂ්පාදනය, කෘෂි කර්මය ආශ්‍රිත කර්මාන්ත පිහිටුවීම සහ පවුල් 500,000 ක් පදිංචි කරවීම යන කටයුතු සඳහා අක්කර 650,000 ක වනපෙත් ප්‍රදේශයක් උපයෝගී කරගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

**වක්‍ර අංක vi**

**මහවැලි ගංගා ද්‍රෝණියෙහි වන සම්පත් 1956 වන විට.**

| | වනාන්තර | මුළු ප්‍රදේශ |
|---|---|---|
| තෙත් කලාපය | 1,38,186 | 7,36,540 |
| අන්තර මධ්‍ය කලාපය | 1,11,550 | 5,51,200 |
| වියළි කලාපය | 8,81,460 | 12,86,970 |
| එකතුව : | 11,31,190 | 25,74,710 |

දිය දහර ගලා බැස්ම පාලනය කිරීම, භූගත ගැඹුරු ජල තැන්පත් වැඩි කිරීම, ජල ගැලීම් සහ පස සෝදා පාළුව සැලකිය යුතු අන්දමින් සීමා කිරීම සහ ජලයෙහි පවිත්‍රතාවය වැඩි දියුණු කිරීම අතින් මහවැලියෙහි ඉහල පෝෂක ප්‍රදේශයෙහි වනාන්තරයන්හි ඇති නෛසර්ගික වටිනාකම පිළිබඳ සැකයක් නොමැත. එහෙයින් මහවැලි ගංගාවෙහි සහ එහි ඇළ දොළ වල ගමන් මග දෙපස ඉවුරු සහ, ඒ වෙනුවෙන් අත්හළ භූමියෙහි ස්වාභාවිකව හෝ වගාකිරීමෙන් හෝ පිහිටා ඇති වෘක්ෂලතාදිය, සුරැකිව පවත්වා ගැනීම අතිශයෙන් වැදගත් වන්නේය.

මහා දේශගුණය කෙරෙහි වනාන්තර වලින් කිසිදු බලපෑමක් ඇති නොවන නමුදු, ක්ෂුද්‍ර දේශගුණය කෙරෙහි එය බෙහෙවින් බලපාන්නේය. එහෙයින් පහළ මහවැලි ප්‍රදේශයෙහි විශාල වනපෙත් තුරන් කරලීම, වෘක්ෂලතා සහ සත්ව ජීවිත කෙරෙහි හානිකර අන්දමින් බලපානු ඇත. එහෙයින් වන සංරක්ෂණය ද ඇතුළු කොට ගනිමින් තර්කානුකූල වූත්, දීර්ඝකාලීන වූත් පදනමක් මත භූමිය බහුවිධ ප්‍රයෝජනයන් සඳහා යොදා ගැනීම ඉතාමත් වැදගති.